# මුහුදු ලොවේ
# මුහුදු රැජීණ



රිසිඳි දිහාසා ගුණරත්න

# මුහුදු ලොවේ මුහුදු රැජින

රිසිඳි දිහාසා ගුණරත්න

ISBN-978-624-208-048-2
දිනය: 2023-12-09

# පිදුම

මේ පොත සැකසීමේදී මා හට

උදව් කල මාගේ දෙමාපියන්ටත්

මාගේ පන්තිභාර ගුරු මෑණියන්ටත්

මහාමායා බාලිකා විදුහලේ

විදුහල්පතිතුමියටත්,

ආදරයෙන් පුදමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මඟපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොටගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් '' දිවිය දිනන විද්‍යුත් පොතක්'' ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ '' දිවිය දිනන විද්‍යුත් පොතක්'' ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලෙඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමණාකරණ මණ්ඩලය ගුරු භවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරු භවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමඟින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය -මහනුවර
2023.10.20

එකමත් එක කාලෙක හිටියා චූටි ළමයෙක්. එයාගේ නම තමයි සමනලී. එයාට හොඳම හොඳ යාළුවෙක් හිටියා. එයා තමයි එන්ටි. එන්ටි හරිම හොඳයි. එයා යාළුවොන්ට උදවු කළා. එක දවසක් මේ දෙන්නා හමුවෙන්න කතා කර ගත්තා.





ඒ දෙන්නා මුහුදේ අයිනේ තිබෙන ගල ගාවට යන්න කතා වුණා. එන්ට්ට තව යාළුවෙක් හිටියා.  එයාගේ නම තමයි ප්‍රින්සි. එයා ලස්සන සුරංගනාවියක්. මේ දෙන්නා ප්‍රින්සිටත් කිව්වා.

ප්‍රින්සි සහ සමනලී ආවා. හැබැයි එන්ටි ආවේ නැහැ. මේ දෙන්නාට හරිම දුකයි. සමනලී කිවුවා. අනේ ඔයාගේ මැජික් යෂ්ටියෙන් එන්ටිව බලන්න පුළුවන්නේ.





එන්ටිගේ අම්මා තමයි මුහුදේ රැජිණ. ප්‍රින්සි දැක්කා එන්ටි හොඳටම අඬනවා. ප්‍රින්සි කිවුවා අපි දෙන්නා එතනට යංකියලා. එයා අඬන්නේ එයාගේ අම්මා නැති නිසා කියලා. එයා අනිත් අයගෙන් ඇහුවලු. හැබැයි ඒ ගොල්ලෝ දැක්කේ නෑ කිවුවා.

ඔයා බය වෙන්න එපා. අපි ඔයාගේ අම්මාව හොයලා දෙන්නම්. ඊට පස්සේ ප්‍රින්සි එයාගේ මැජික් යෂ්ටියෙන් එයා ඉන්න තැන බැලුවා.






එයා දැක්කා මිනිස්සු එයාව කූඩුවකට දාලා තියෙනවා මෙයාලා ඉක්මනට එතනට ගියා. යතුර අරගෙන දොර ඇරියා.

එන්ටි එයාගේ අම්මා එක්ක මුහුදු මාළිගයට ගියා, සමනලී ගෙදර ගියා. ප්‍රින්සි සුරංගනා ලෝකයට ගියා.

එක දවසක් මුහුදු මාළිගයේ ලොකු සාදයක් තිබුණා. ඒ සාදයට මේ දෙන්නාටත් මුහුදු රැජිණා ආරාධනා කළා.





කෑම බීම ගොඩාක් තිබුණා. ඒවා හරිම රසයි. මාළු යාළුවෝ අපිට කතා කළා . අපි මාළුවොන්ට කතා කළා.

මුහුදු රැජිණ කිවුවා එයාලට මේ මාළිගයේ නතර වෙන්න කියලා. මේ දෙන්නා එකවර හා! හා! කිවුවා මේ දෙන්නාට ලස්සන කාමරයක් හම්බ වුණා. ඒක හරිම ලස්සනයි. ලස්සන ඇඳවල් තිබුණා. ඒක ආරක්ෂා කරන්න ඩොල්ෆින් යාළුවෝ දෙන්නෙක් හිටියා. එයාලා හිමිහිට මෙයාලත් එක්ක යාළු වුණා. මෙයාලට හරිම සතුටුයි.



මෙයාලා ඩොල්ෆින් යාළුවොත් එක්ක හොඳට යාළු වුණා.

- නිමි -



# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී ඒ යටතේ වැඩාම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය පාසල තුළ ගොඩනැගී ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදන වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මඟපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු


මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023.10.20